// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2139/50 - 2019 සැප්තැම්බර් මස 04 වැනි බදාදා - 2019.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මාගේ යොමු අංකය* : ජීසීඑෆ්/අත්/KD/23/එල්ආර්.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 13/97/එල්ආර්බී/360.

මහ කොළඹ ගංවතුර පාලනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පාර්ලිමේන්තු වැව ඉස්මත්තේ ජල රැඳවුම් ප්‍රදේශය සඳහා පහත විස්තර කර ඇති ඉඩම රජයට පවරාගෙන ඇති බව 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*රජයට පවරා ගන්නා ලද ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩුවෙල මහනගර සභා සුළු කොට්ඨාසයේ අංක 479-එෆ්, අරුප්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පැලවත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2019.01.31 දිනැතිව පිළියෙල කර ඇති අංක 9790 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 සහ 02 වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1892 ක් වූ පහත විස්තර කර ඇති ඉඩම් කැබලි දෙක (02) :

**කැබලි අංක 01**

ඉඩමේ නම: සොයාගත නොහැක; ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අංක 47/50, පෙරේරා මාවත, දකුණු තලංගම, බත්තරමුල්ල ලිපිනයෙහි පදිංචි ඩබ්. කේ. පී. එන්. පෙරේරා; ප්‍රමාණය: හෙක්ටයාර 0.1629.

**කැබලි අංක 02**

ඉඩමේ නම: සොයාගත නොහැක; ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අංක 41/1, පාගොඩ පාර, නුගේගොඩ ලිපිනයෙහි පදිංචි වැලකඩගේ හදා රෝහණ පෙරේරා; ප්‍රමාණය: හෙක්ටයාර 0.0263.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය පැවරූ අයවලුන් 2019.10.28 දින පෙ.ව. 9.30 ට රාජගිරිය, වැලිකඩ, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ

පිහිටා ඇති මහ කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතියේ ඉඩම් අත්කර ගැනීමේ නිළධාරි කාර්යාලයේ දී මා හමුවිය යුතු ය.

තව ද 2019.10.16 දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභායන් එකී ඉඩම අත්කර ගැනීම සඳහා වන්දි මුදල් ඉල්ලා සිටීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, ඒ සඳහා ඉල්ලා සිටින වන්දි මුදල හා එය ගණනය කළ ආකාරයත් පිටපත් දෙකක් සහිත ලියවිල්ලක් මා වෙත ඉදිරිපත් කළ යුතු ය.

සී. ඩබ්ලිව්. අබේසූරිය,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
මහ කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2019 සැප්තැම්බර් මස 03 වැනි දින,
මහ කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය,
අත්කර ගැනීමේ නිලධාරි කාර්යාලය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ,
රාජගිරිය.

09 - 628

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.